සී/ස මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්ගලික) සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව 2023/2024

සී/ස මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්ගලික) සමාගමට අදාළව 2023 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2007 අංක 7 දරණ සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කල යුතු 2023 හා 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2025 මාර්තු 31 වන දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

2. විගණන නිරීක්ෂණ

2.1 ස්ථාපිත කිරීම

	නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාර්ග සංවර්ධන අධිකාරිය සතු සමාගමක් වශයෙන් ක්‍රියා කරන ලද මාර්ග නිර්මාණ හා සංවර්ධන පෞද්ගලික සමාගම (RC & DC) මුළුමනින්ම වසා දැමීමටත්, පෞද්ගලික පොදු සමාගමක් පිහිටුවීමේ හැකියාව පිළිබඳව මහාමාර්ග අමාත්‍යංශය සහ භාණ්ඩාගාරය විසින් පරීක්ෂා කර බැලීම සඳහාත් 2004 ජනවාරි 21 දින පැවති අංක: අමප/04/0053/104/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලබා දී තිබුණද, ඊට අනුකූල නොවන පරිදි සමාගම සංස්ථාපනය කර තිබුණි.	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත.	රජයේ නීතිරීති, අමාත්‍යමණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු කර රජය සතු අයිතිය සුරක්ෂිත කිරීමට පියවර ගත යුතුය.

(ආ)	ඉදිකිරීම් කර්මාන්ත සංගමය සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ජාතික සංගමය සමඟ හවුල්කාරිත්වයකට එළඹීමෙන් සමාගම පිහිටුවීම සඳහා 2004 අගෝස්තු 27 දිනැති අංක 04/0848/004/013- I දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අනුමැතිය ලබා දී තිබු නමුත් එම අමාත්‍ය මණ්ඩල අනුමැතියට පෙර මාර්ග සංවර්ධන අධිකාරියේ අංක 795/2004 දරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත 2004 ජුනි 11 වන දින සමාගම සංස්ථාපනය කර තිබුණි.	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත.	රජයේ නීතිරීති, අමාත්‍යමණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු කර රජය සතු අයිතිය සුරක්ෂිත කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	සමාගමේ බහුතර අයිතිය භාණ්ඩාගාරයට පැවරෙන පරිදි ඉතිරි කොටස මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන පරිදි සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට 2013 පෙබරවාරි 18 දිනැති අංක 13/0134/505/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ලබා ගෙන තිබුණද, එම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කර නොතිබුණි.	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත.	රජයේ නීතිරීති, අමාත්‍යමණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු කර රජය සතු අයිතිය සුරක්ෂිත කිරීමට පියවර ගත යුතුය.

2.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට වසර 01 හා මාස 07 ක් ප්‍රමාද වි 2024 ඔක්තෝබර් 08 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර 2023 හා 2024 වර්ෂ සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන මේ දක්වා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත.	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/01/2021 දරන රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 6.6 වගන්තිය ප්‍රකාරව සෑම රාජ්‍ය සමාගමකම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

2.3 වත්කම්, වගකීම් ආදායම් හා වියදම්

සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පහත පරිදි විය.

විස්තරය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.)
මුළු වත්කම්	34,943,756,587
මුළු හිමිකම	3,042,851,785

මුළු වගකීම්	31,900,904,802
ආදායම	18,370,592,517
විකුණුම් පිරිවැය	17,451,262,405
දළ ලාභය	919,330,112
අනෙකුත් ආදායම්	401,884,682
වියදම්	561,569,481
බදු	95,853,101
ලාභය/ (අලාභය)	663,792,213

2.4 පසුගිය වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සිදු වී තිබූ ගිණුම්කරණ අඩුපාඩු, නොසැසඳීම්, වැරදි, අත්හැරීම් හා සාක්ෂි ඉදිරිපත් නොවීම තුළ විගණකගේ විෂය පථය සීමා වීම හේතුවෙන් 2018, 2019 හා 2021 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතය ව්‍යාචනය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනයන් දුර්වල වීම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම, ගිණුම්කරණ අඩුපාඩු, නොසැසඳීම් සහ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත වීම සම්බන්ධයෙන් වූ කළමනාකරණ නොඑකඟතාවය හේතුවෙන් 2020 හා 2022 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයන් ලබා දී තිබුණි.

2.5 සමාගමේ අඛණ්ඩ පැවැත්ම හා මෙහෙයුම් කටයුතු

	නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සී/ස මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ (පුද්ගලික) සමාගම, සී/ස මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්ගලික) සමාගම සහ සී/ස මගනැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ (පුද්ගලික) සමාගම ඒකාබද්ධ කර තනි සමාගමක් පිහිටුවීමට 2023 මාර්තු 28 දිනැති අංක 23/0394/608/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ගෙන තිබුණු බැවින් පෞද්ගලික සමාගක් විසින් තමන්ට ලැබිය යුතු මුදල් සියල්ල ගෙවා ඇවර කරන මෙන් ඉල්ලා 2023 මැයි 02 වන දින නඩු පවරා තිබුණි. ඊට අමතරව නැවතත් අධිකරණ ක්‍රියාවලියෙන් බැහැරව ඔවුන්ගේ අභිමතය පරිදි සමාගම ගණන් බේරා වසා දමන ක්‍රමයක් අනුගමනය කරන බවත්, තෝරා ගත් සේවා සපන්නන් හා ණය හිමියන් වෙත මුදල් ගෙවීමත්, නිශ්චල දේපල බැහැර කිරිමටත් කටයුතු කරන බවත් පෞද්ගලික සමාගම විසින් පෙන්වා දී තිබුණි. ඒ අනුව තාවකාලික ඇවරකරුවෙකු පත් කිරිමට හා අධිකරණ ක්‍රියාවලියෙන් බැහැරව ඇවර කිරීමට සමාගමේ කටයුතු වළක්වාලමින් සමාගම වෙත අතුරු නියෝගයක් අධිකරණය විසින් නිකුත් කර ඇත. 2023 අගෝස්තු 10 දින සිට 2023 සැප්තැම්බර් 01 දින දක්වා කාල පරිච්ඡේදය තුල	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත.	රජයේ ප්‍රතිපත්තියට අනුකූලව නීත්‍යානුකූල ප්‍රතිපාදන අනුව සමාගමේ ඇවර කිරීමේ කටයුතු අවසන් කළ යුතුය.

	අධිකරණය විසින් පෞද්ගලික ආයතනයක් තාවකාලික ඈවරකරුවෙකු ලෙස පත් කර තිබූ අතර ඔහුගේ කාර්යයන් බැංකු ගිණුම් හා භාණ්ඩාගාර බිල්පත් පරිපාලනය කිරිම සඳහා පමණක් සිමා විය. කෙසේ නමුත් වරින් වර තාවකාලික ඈවරකරුවෙක් පත් කිරීම හා ඉවත් කිරීම සිදු වුවද විගණිත දිනය වන විටත් සමාගමේ ඈවර කිරීමේ කටයුතු අවසන් වී නොතිබුණි. එසේම නව සමාගමක් පිහිටුවීමේ කටයුතු ද සිදුකර නොතිබුණි.		
(ආ)	තාවකාලික ඈවරකරුවකු පත්කිරීමේ නියෝගය ඉවත් කල පසු නැවත 2024 අගෝස්තු 02 වන දින සේවා සපයන්නන් හා ණයහිමියන් වෙත ගෙවීම් ආරම්භ කර තිබූ අතර එදිනට සේවා සපයන්නන් හා ණය හිමියන් වෙත ගෙවිය යුතු ශේෂය රු.8,570,116,489 ක් වූ අතර 2025 පෙබරවාරි 21 දිනට ඉන් රු.4,124,527,967 ක් ගෙවා තිබුණු අතර තව දුරටත් ගෙවීමට ඇති ශේෂය රු.4,445,588,522 ක් විය. නමුත් 2025 මැයි 08 දිනට සමාගමේ පරිගණක දත්ත පද්ධතියේ දත්තවලට අනුව 2024 අගෝස්තු 02 දිනට සේවා සපයන්නන් හා ණය හිමියන් වෙත ගෙවිය යුතු ශේෂය රු.8,659,481,440 ක් ද, 2025 පෙබරවාරි 21 දිනට තව දුරටත් ගෙවීමට ඇති ශේෂය රු.4,562,128,576 ක් ද වූ අතර අදාළ තහවුරු කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.	2025 මැයි 08 වන දිනට පරිගණක දත්ත පද්ධතියේ ඇති දත්තවලට අනුව 2024 අගෝස්තු 02 වන දිනට සේවා සපයන්නන් හා ණය හිමියන් වෙත ගෙවිය යුතු ශේෂය රු.8,659,481,440 ක් වේ. එසේම 2025 පෙබරවාරි 21 වන දිනට පරිගණක පද්ධතියේ දත්ත අනුව සේවා සපයන්නන් හා ණය හිමියන් වෙත ගෙවීමට ඇති ශේෂය රු.4,562,128,576 ක් විය.	අදාළ තහවුරු කිරීම් සහිතව ගෙවිය යුතු ශේෂ නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ස්වෙච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමයක් හඳුන්වා දිම මගින් කාර්ය මණ්ඩලය අඩු කිරීමෙන් පසු මාර්ග සංවර්ධන අධිකාරිය සතු මහනැගුම සමාගම් තුනක් ඒකාබද්ධ කර නව සමාගමක් පිහිටුවීමට 2023 මාර්තු 28 දිනැති අංක අමප/23/0394/608/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඈවර කිරීමේ කටයුතු අවසන් වන තෙක් අවශ්‍ය කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට කටයුතු කළ යුතුය. එසේ වුවත්, 2023 මාර්තු 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සමාගමේ සේවකයන් විශ්‍රාම ගැන්වීමට තිරණය කර තිබුණි. මෙහෙයුම් නතර කිරිමට පෙර සමාගම තුල 804 ක සේවක සංඛ්‍යාවක් සේවයේ නිරත වූ අතර ස්වෙච්ඡා විශ්‍රාම ගැන්වීම ක්‍රමය යටතේ 2024 වර්ෂය අවසන් වන විට සේවකයින් 670 දෙනෙකු රු.740,187,761 ක වන්දි ගෙවා විශ්‍රාම ගන්වා තිබුණි. මීට අමතරව සේවය අවසන් කිරිමේ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සේවකයින් 121 දෙනෙකු රු.85,407,916 ක මුදලක වන්දි ගෙවා	විශ්‍රාම ගන්වන ලද සේවකයින් හට ගෙවා ඇති අගයන් නිවැරදිය.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඈවර කිරීමේ කටයුතු අවසන් වන තෙක් අවශ්‍ය කාර්යමණ්ඩලය රඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

	අනිවාර්ය විශ්‍රාම ගන්වා තිබුණි. මෙම අනිවාර්ය හා ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රියාත්මක කිරීමේදී සමාගම ඈවර කිරීම දක්වා වූ කටයුතු මෙහෙයවීම සඳහා අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය හඳුනා ගෙන එම පිරිස රඳවා ගෙන නොතිබුණි.		
(ඇ)	සමාගමේ මෙහෙයුම් කටයුතු නවතා තිබියදී 2023 මැයි 30 දින අධ්‍යක්ෂ මණ්ඩල තිරණයට අනුව ස්වේච්ඡා හා අනිවාර්ය විශ්‍රාම ගිය පිරිසෙන් 91 දෙනෙකු කාර්යය පැවරුම් ගිවිසුම් මත හා තවත් අලුතින් තුන්දෙනෙක් කාර්යය පැවරුම් පදනම මත බඳවා ගෙන තිබුණි. මෙම නිලධාරින් සඳහා 2023 ජුනි 01 දින සිට 2025 පෙබරවාරි 28 දින දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු.172,280,973 ක් ගෙවා තිබුණද සමාගම ඈවර කිරිමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. එසේම, මේ දක්වා මෙම සේවකයින් තෝරා ගැනිමේ පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර මෙහෙයුම් කටයුතු නවතා තිබෙන පසුබිමක් තුළ 2023 ජූනි 06 වන දින සිට රු. 245,000 ක මාසික වැටුපක් මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) තනතුරු සඳහා හා මාසික රු.172,000 ක වැටුපක් මත මූල්‍ය කළමනාකරුවන් දෙදෙනෙකු බඳවා ගැනිමට ප්‍රමාණවත් අවශ්‍යතාවයක් විගණනයට නිරික්ෂණය නොවීය.	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) යන තනතුරට බඳවා ගන්නා ලද නිලධාරියා මසක පමණ කාලයක් සේවයෙහි නිරත විය. පසුව එම තනතුරට කිසිදු බඳවාගැනිමක් සිදු කර නොමැත. නමුත් සේවා අවශ්‍යතාවය මත මූල්‍ය කළමනාකරුවන් දෙදෙනෙකු බඳවා ගෙන ඇත.	අනාර්ථික වියදම් අවම කිරීමට හා අමාත්‍ය මණ්ඩල තීරණය නොපමාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2023 මාර්තු 28 දිනැති අංක අමප/23/0394/608/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම සමාගමේ මෙහෙයුම් කටයුතු අවසන් කර කාර්ය මණ්ඩලය විශ්‍රාම ගන්වා තිබුණ ද, සමාගම සතුව පහත සඳහන් නිශ්කාර්ය, ඌන උපයෝජිත හා අක්‍රීය වත්කම් පැවති බව විගණනයේ දී නිරීක්ෂණය විය. • සමාගම සතු පිළිවෙලින් රු.588,762,952 ක් හා රු.116,148,540 ක් පිරිවැය වූ යන්ත්‍ර පිරියත 66 ක් හා වාහන 32 ක් සහ වටිනාකම නොදන්නා යන්ත්‍ර පිරියත 90 ක් හා වාහන 60 ක්ද, පැලියගොඩ, ගනේවල්පල, අම්බලන්ගොඩ, කටුගම්පල, කුණ්ඩසාලෙ හා කුරුණෑගල යන වැඩබිම් පරිශ්‍රයන් තුළ භාවිතා කරන ලද වටිනාකම නොදන්නා ලී බඩු හා උපකරණ විශාල ප්‍රමාණයක් සමාගමේ ආපන ශාලාවේ සහ සුබ සාධක සංගම් කාර්යාලයේ නිශ්කාර්ය වත්කම් ලෙස තිබීම.	යන්ත්‍ර / වාහන ප්‍රමාණයන් පිළිබඳව ඒකඟ විය හැක. නමුත් ඒම සංචිතය නිෂ්කාර්ය වත්කම්, ඌන උපයෝගිතා වත්කම් හා අක්‍රිය වත්කම් පිරිවැය ලබා ගත් මූලාශ්‍ර පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැත.	භාවිතයට ගත හැකි වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමටත් අක්‍රීය වත්කම් අපහරණය කිරීමටත් නොපමාව කටයුතු කළ යුතුය.

- සමාගම සතු පිරිවැය රු.38,595,000 ක් වූ වාහන 05ක් සහ වටිනාකම නොදන්නා වාහන 05ක් හා යන්ත්‍ර පිරියත 03ක් ඌන උපයෝජිත වත්කම් ලෙස පැවතීම.

- සමාගම සතු පිරළිවෙලින් රු.16,750,000 ක් හා රු.18,858,000 ක් පිරිවැය වූ යන්ත්‍ර 14 ක් හා වාහන 04 ක් සහ වටිනාකම නොදන්නා යන්ත්‍ර 12 ක් හා වාහන 09 ක් අක්‍රීය වත්කම් ලෙස පැවතීම.

- මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දි තිබූ වටිනාකම නොදන්නා යන්ත්‍ර පිරියත 44 ක් හා වටිනාකම නොදන්නා වාහන 50 ක් නිෂ්කාර්ය වත්කම් වශයෙන් සමාගම්පරිශ්‍රයේ හා වැඩබිම් වල ගාල් කර තිබීම.

2.6 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

	නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 අංක 7 දරන සමාගම් පනතේ 78 වගන්තිය	සෑම සමාගමක්ම, එහි කොටස් වෙන් කළ දින සිට මාස 2ක් ඇතුළත සහ එවැනි කොටස් සමාගමට පැවරූ දින සිට මාස දෙකක් ඇතුළත, සියලුම කොටස්වල සහතික සම්පූර්ණ කර භාර දීමට සූදානම් කර තිබිය යුතු වුවද, සමාගමේ පූර්ණ අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය සතු වුවත් ඊට අදාල කොටස් සහතික මේ දක්වා නිකුත් කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත	සමාගමේ පූර්ණ හිමිකාරීත්වය මාර්ග සංවර්ධන අධිකාරිය තුලින් රජයට හිමිවන පරිදි අයිතිය තහවුරු කිරීමට කටයුතු කල යුතුය.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.2 වගන්තිය	මූල්‍ය වර්ෂය තුල අවම වශයෙන් මාස 03 කට වරක්වත් විගණන කමිටුව රැස්විය යුතු වුවත් සමාගම ආරම්භයේ සිට මේ දක්වා විගණන කමිටු පවත්වා නොතිබුණි. ඒ අනුව යහපාලන මූලධර්මය නොසලකා සමාගමේ කටයුතු	මේ වන විට විගණන කමිටුව පත් කර ඇත.	යොමුගත චක්‍ර ලේඛය ප්‍රකාරව විගණන කමිටු පත්කර අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස් වී අවශ්‍ය නිර්දේශයන් ලබා දිය යුතුය.

මෙහෙයවීම හා පාලනය සිදුකර තිබුණි.

2.7 නඩු කටයුතු

	නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සී/ස මහනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමට විරුද්ධව සමාගමේ සේවය කළ සේවකයින් හා නිලධාරීන් විසින් පැවරූ නඩු 06 ක් ද, වෙනත් පාර්ශ්වයන් විසින් පැවරූ නඩු 06 ක් ද 2025 පෙබරවාරි 01 වන දින වන විටත් අවසන් වී නොතිබුණු අතර සමාගම විසින් මෙම නඩු සඳහා රු.95,765,807 ක නීතිඥ වියදම් දරා තිබුණි.	විගණන නිරීක්ෂණය සමඟ එකඟ වී ඇත.	සමාගමට එරෙහිව පවතින නඩු කටයුතු කඩිනමින් අවසන් කර ගැනීමට සමාගමේ සහයෝගය උපරිම වශයෙන් ලබා දී රජයේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි නඩු කටයුතු කඩිනමින් අවසන් කරගත යුතුය.

2.8 මුදල් කළමනාකරණය

	නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම විසින් පුද්ගලික ආයතනයක් වෙත මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියකට අදාළව ගෙවීමක් සඳහා නිකුත් කරන ලද රු.464,348.79 වටිනාකමින් යුත් චෙක්පත සඳහා මහජන බැංකුවේ කටුබැද්ද ශාඛාවේ සමාගම නමින් පවත්වා ගෙන යන ජංගම ගිණුමට රු.21,846,432.10 ක් බැංකුව විසින් හර කර තිබුණි. මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණක මූලික විමර්ශනයක් සිදු කර තිබුණි. එම විමර්ශනයේ වාර්තාවට අනුව චෙක්පතෙහි වටිනාකම කූඨ ආකාරයෙන් වෙනස් කර (රජයේ රස පරීක්ෂණ වාර්තාවට යටත්ව) මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු කර ඇති බවත්, සමාගමේ සභාපති, සාමාන්‍යාධිකාරී, මූල්‍ය නිලධාරිනි සහ මූල්‍ය අංශයේ සේවය කරන නිලධාරින් මෙම මූල්‍ය අක්‍රමිකතාවය සිදු කිරීමට සම්බන්ධ වීම පිළිබඳ සැක කටයුතුභාවය බැහැර කල නොහැකි බවත් සඳහන් කර තිබුණ ද උක්ත මූල්‍ය වංචාව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග මේ වන තෙක් ආරම්භ කර නොතිබුණි.	2024.12.18 දින මූල්‍ය අංශයේ කටයුතු යම් ආරක්ෂක ක්‍රියාදාමයකට යටත්ව ක්‍රියාත්මක කිරීම සඳහා සභාපති හා සාමාන්‍යාධිකාරිගේ වැටුප් අත්හිටුවා මූල්‍ය අංශයේ කටයුතු වඩාත් සුරක්ෂිතව කරගෙන යාම සඳහා මාර්ග ගත ගෙවීම් ක්‍රමය අනුගමනය කිරීම හා මේ සම්බන්ධයෙන් විශේෂ අපරාධ විමර්ශන අංශයේද විමර්ශනයක් සිදු කරන ලෙස පැමිණිලි කිරීමෙන් පසු, පරීක්ෂණ කටයුතු සිදු වේ. මෙය අපරාධ වරදක් (Criminal Offence) බැවින් මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පවතින පරීක්ෂණ අවසන් වූ පසු නිකුත් කරන වාර්තා හා නිරීක්ෂණ මත අදාල වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.	මූල්‍ය වංචාව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කඩිනමින් විනයානුකූල ක්‍රියාමාර්ග හා නිත්‍යානුකූල පියවර ගත යුතුය. ඒ අනුව එම පාඩුව අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට ද ඉදිරියේදි මෙවැනි වංචාවන් ඇතිවීම වැළැක්වීමට ද අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය.
(ආ)	වරකට රු.10,000ක උපරිමයකට යටත්ව ආහාරපාන, ඉන්ධන හා සාමාන්‍ය කටයුතු හි සුළු	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත.	සුළු මුදල් පාලනය සඳහා මනා අභ්‍යන්තර පාලන

	වියදම් දැරීම සඳහා පිළිවෙළින් රු.60,000, රු.100,000 හා රු.150,000 වශයෙන් සුළු මුදල් අග්‍රිමයන් 03ක් සමාගම විසින් 2023 නොවැම්බර් මස සිට පවත්වාගෙන යයි. 2024 වර්ෂය අවසන් වන විට ඉන්ධන වියදම් රු. 2, 462,927 ක්ද, ආහාරපාන වියදම් රු.2, 547,153 ක්ද, සාමාන්‍ය කටයුතු සඳහා රු.1,192,981 ක්ද වශයෙන් රු.6,203,061 ක් වැය කර තිබුණි. සුළු මුදල් ගෙවීම සඳහා සුළු මුදල් වව්චර් වෙනුවට IOU වවුචර් භාවිතා කර තිබුණ අතර සුළු මුදල් පොත වෙනුවට පැතුරුම්පතක් (Excel) ආධාරයෙන් සටහන් කිරීම පමණක් සිදු කර තිබුණි. ඒ අනුව සමාගම සුළු මුදල් වියදම් ගෙවීම සඳහා මනා අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි.		ක්‍රමයක් සමාගම විසින් ස්ථාපිත කළ යුතුය.
(ඇ)	සමාගමේ අක්‍රිය බැංකු ජංගම ගිණුම් 06ක 2024 දෙසැම්බර් 31 දින වන විට වසර දෙකත් හතරත් අතර කාල පරාසයක් තුළ පවත්නා රු. 6,313,510 ක ශේෂයක් පැවතිය ද, මෙම අක්‍රිය බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කර නොතිබුණි.	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත. ඉදිරියේදී මෙම ගිණුම් වසා දැමීමට කටයුතු කරනු ඇත.	ජංගම ගිණුම්වල ඇති මුදල් ඵලදායී ලෙස ආයෝජනය කර උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

2.9 ප්‍රසම්පාදන කළමනාකරණය

	නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය අනුව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 5 ක කාර්යසාධන බැඳුම්කර සමාගම විසින් ලබා ගත යුතු වුවත් රු.මි. 125,730 ක් වටිනා වැඩ ඇණවුම් 1753 න් 1608 ක් සඳහා කාර්ය සාධන බැඳුම්කර ලබා ගෙන නොතිබුණි.	කාර්ය සාධන බැඳුම්කර ලබා නොදුන් සේවා සැපයුම්කරුවන්ගේ අනුමත වූ බිල්පත් ගෙවීමේදි පවරන පද වැඩ කටයුත්ත අවසන් වන තෙක් කාර්ය සාධන බැඳුම්කරයට අදාලව මුදල් රඳවා ගැනීම සිදුකොට ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ උපදෙස් අනුගමනය කිරීමකින් තොරව කටයුතු කිරීමට සම්බන්ධ පාර්ශවයන් හඳුනාගෙන විධිමත් පියවර ගතයුතුය

2.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2020, 2021 සහ 2022 වර්ෂවල කිලෝමීටර් 100,000 මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 193,518 ක් වටිනා වැඩ නියෝග 2481 ක් සමාගමට	මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පිළිබඳ අප ආයතනය දැනුවත් වී නොමැත.	වැඩ ඇණවුම් භාර ගැනීමේ දී එහි ක්‍රියාකාරීත්වයට අදාළ වන නීති රීති රෙගුලාසි පිළිබඳව පූර්ව දැනුවත් වීමට හා එකඟ වීමට සමාගම විසින්

	ප්‍රදානය කර තිබුණි. එයින් රු.මිලියන 32,736 ක් වටිනා වැඩ ඇණවුම් 351 ක් අවලංගු කර ඇති අතර රු. මිලියන 29,130 ක් වටිනා වැඩ ඇණවුම් 306 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. රු.මිලියන 5,920 ක් වටිනා වැඩ ඇණවුම් 71 ක කොන්ත්‍රාත් වැඩ ඍජුව සිදු කිරීම සඳහා සමාගම විසින් භාරගෙන තිබූ අතර එය මුළු වැඩ ඇණවුම් වලින් සියයට 03 ක් පමණි. 2008 අගෝස්තු 01 දින මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන තිබූ තීරණයට පටහැනිව මුළු ඇණවුම් වටිනාකමෙන් සියයට 97 ක් වූ රු. මිලියන 125,730 ක වැඩ ඇණවුම් 1,753 ක් උප කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි.		කටයුතු කළ යුතුය.
(ආ)	කිලෝමීටර් 100,000 මාර්ග ව්‍යාපෘතියේ 2022 වර්ෂය තුළ දිග කි.මී. 3575 ක් වූ මාර්ග 2557 ක් නිමකිරීමට සැලසුම් කර තිබූ නමුත් වර්ෂය අවසන් වන විට දිග කි.මී.1420 ක් නිමකරන ලද මාර්ග සංඛ්‍යාව 970 ක් පමණි. එනම් අපේක්ෂිත ඉදිකිරීම් දුර ප්‍රමාණයෙන් සියයට 38 ක් පමණක් නිම කර තිබුණි. උප කොන්ත්‍රාත් මඟින් ලද සියයට 5 ක ආදායම මූල්‍ය ප්‍රකාශනයන්හි ආදායම යටතේ ද, උප කොන්ත්‍රාත් වියදම විකුණුම් පිරිවැය යටතේ ද දක්වා අදාළ ගණනය කිරීම් සිදු කර තිබුණු නමුත්, 2023 වර්ෂය සඳහා ආදායම් ගිණුම් ගත කිරීම මේ වන තෙක් සම්පූර්ණ ලෙස සිදු කර නොමැති බව ආයතනය විසින් දන්වා තිබුණි.	2022.05.02 දින වන විට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කි.මී.100,000 මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් නවතා දැමීම හේතුවෙන් අපේක්ෂිත ඉදිකිරීම් දුර ප්‍රමාණයෙන් සියයට 38ක් පමණක් වැඩ නිම කිරිමට සිදු වී ඇත.	භෞතික කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු අතර ආදායම් කාලීනව ගිණුම් තැබිය යුතුය.
(ඇ)	සමාගම විසින් 2020 වර්ෂය තුළ කිලෝමීටර් 100,000 මාර්ග ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීම් ප්‍රගතිය ඇගයීම සඳහා පළාත්, දිස්ත්‍රික් සහ කලාප සම්බන්ධීකාරකවරුන් බඳවා ගෙන තිබූ අතර, 2022 වර්ෂය තුළ සම්බන්ධීකාරකවරුන්ට ගෙවීම් වශයෙන් රු.මිලියන 16ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සම්බන්ධීකාරකවරුන් බඳවා ගැනීමට අදාළ තොරතුරු සහ සම්බන්ධීකාරකවරුන් විසින් සපයන ලද ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. එබැවින්, සුදුසුකම් ලත් පිරිස් විධිමත් හා විනිවිදභාවයකින් බඳවා	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත.	විගණනයට අවශ්‍ය තොරතුරු ලිපි ලේඛන නොපමාව ලබා දිය යුතු අතර සුදුසුකම් සහිත සම්බන්ධීකාරකවරුන් විධිමත් පරිදි බඳවා ගැනීමටද, කාර්ය ප්‍රගතිය පරීක්ෂා කිරීමෙන් පසුව පමණක් ගෙවීම් කිරීමටද කටයුතු කල යුතුය.

	ගත්තේද හා කාර්යය ප්‍රගතිය ඇගයීමෙන් පසු සම්බන්ධීකාරකවරුන්ට ගෙවීම් කර තිබේද යන්න විගණනයට තහවුරු කර ගත නොහැකි විය.		
(ඇ)	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා වන පිරිවැය ඇස්තමේන්තුව රේටයන් මත සකස්කර එයට සියයට 25 ක ලාභ ආන්තිකයක් එකතුකර කොන්ත්‍රාත් වටිනාකම තීරණය කර කොන්ත්‍රාත්තුව සමාගම වෙත පිරිනමන අතර සමාගම විසින් ඉහත ලාභ අන්තිකයෙන් සියයට 20 ක ප්‍රතිශතයක් උප කොන්ත්‍රාත් කරුවන් වෙත ලබාදී සියයට 5 ක ලාභ ආන්තිකයක් සමාගම වෙත තබා ගැනීමෙන් 2023 වර්ෂය තුල ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලට මැදිහත් නොවී රු. මිලියන 1,386 ක් ලාභයක් මාර්ග සංවර්ධන අධිකාරිය සහ සේවා සපයන්නන් අතර අතරමැදියෙකු ලෙස ක්‍රියා කිරීමෙන් උපයාගෙන තිබුණි.	2023 වර්ෂය සඳහා ආදායම් ගිණුම්ගත කිරිම මේ වන තෙක් සම්පූර්ණ ලෙස සිදු කර නොමැත. මෙම ගණනය සඳහා ද තවදුරටත් පැහැදිලි කර ගැනීම අවශ්‍ය වනු ඇත.	රජයට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි රජයේ අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය.

2.11 කළමනාකරණ අකාර්යක්ෂමතා

	නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගම විසින් බැංකු ඇපකර ලබා නොගෙන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් 38 දෙනෙකු වෙත 2025 පෙබරවාරි 01 දිනට ලබා දී තිබූ නොපිය වූ වැඩ පූර්ව අත්තිකාරම්වල වටිනාකම රු. 965,997,986 ක් විය. එහි අවුරුදු 5 ට වැඩි රු.584,583,650 ක් වූ අතර එම ශේෂය තුළ අවුරුදු 7 ත් 10 ත් අතර රු.420,194,759 ක පැරණි ශේෂ ද පැවතුණි.	විගණනයේදි ඉදිරිපත් කර ඇති දත්ත ලබා ගත් මූලාශ්‍ර (source documents) පිළිබඳව තවදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වනු ඇත.	බැංකු ඇපකර ලබා නොගෙන වැඩ පූර්ව අත්තිකාරම් ගෙවූ නිලධාරීන්ට විරුද්ධව විධිමත් පියවර ගත යුතු අතර නොපිය වූ වැඩ පූර්ව අත්තිකාරම් ප්‍රමාණය අය කර ගැනීමට ද කටයුතු කළ යුතුය.
(ආ)	2025 පෙබරවාරි 18 දිනට සමාගම විසින් වැඩ ඇණවුම් 256 ක් සඳහා බැංකු ඇපකරලබා ගැනීමෙන් තොරව රු.1,401,702,495 ක් වැඩ පූර්ව අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.	විගණනයේදි ඉදිරිපත් කර ඇති දත්ත ලබා ගත් මූලාශ්‍ර (source documents) පිළිබඳව තවදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වනු ඇත.	වැඩ පූර්ව අත්තිකාරම් ලබා දීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් හා වලංගු බැංකු ඇපකර ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකර වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීම සම්බන්ධව අදාළ නිලධාරීන්ට විරුද්ධව විධිමත් පියවර ගත යුතුය.

(ඇ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය පාලන බලතල බෙදා හැරීමක් කල යුතු වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සීමාවන් තුළ විධිමත්ව අධිකාරි බලය බෙදා හැරීමක් සිදු කර නොතිබූ අතර සමාගමේ ගණුදෙනු සම්බන්ධයෙන් අධිකාරි බලය ක්‍රියාත්මක කිරීමේදී එක් එක් ගණුදෙනුව නිළධාරීන් දෙතුන් දෙනෙකුගේ මාර්ගයෙන් පරීක්ෂණයට භාජනය වන පරිදි බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම කිහිප දෙනෙකු අතර බෙදා නියම කිරීම හා එවැනි බලතල පැවරීමේදී ගණුදෙනුවේ ස්වරූපය හෝ මුදල් ප්‍රමාණය හෝ යම් යම් සීමා පැනවීම් නිශ්චිතව, ලිඛිතව ලබා දීමත් සිදු වී නොතිබුණි. ඒ අනුව සමාගමේ ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම විධිමත් පාලනයකින් තොරව සිදු කර තිබුණි. ඒ තුළ වංචා, දූෂණ හා අක්‍රමිකතා සිදු වීමේ හා ඒවා අනාවරණය නොවීමේ දැඩි අවධානමක් පැවතුණි.	විගණන නිරීක්ෂණයට එකඟ වී ඇත.	අනුමත නීති, රීති හා රෙගුලාසි වලට අනුකූලව සමාගම විසින් කටයුතු කළ යුතු අතර ඒ පිළිබඳ පසුවිපරම් කිරීමද නිරතුරුව සිදු විය යුතුය. .

2.12 පද්ධති හා පාලන

	නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගමේ මූල්‍ය වාර්තාකාරණ කටයුතු සඳහා පරිඝනක මෘදුකාංගයක් භාවිතා කර තිබූ අතර මෙම මෘදුකාංගය මගින් ගෙවීම්, මාර්ගගත ක්‍රමයට (online) සිදු කරනු ලැබුවද ලැබීම් මාර්ගගත ක්‍රමයට (online) සිදු කිරීමට නොහැකි වී ඇති බැවින් හා මෙම පද්ධතිය තුල පහත සඳහන් පාලන දුර්වලතාද නිරීක්ෂණය වන බැවින් මූල්‍ය වාර්තාකරණයට අදාල තොරතුරුවල නිවැරදිතාවය, විශ්වාසදායිත්වය පිළිගත හැකි මට්ටමක නොතිබුණි. • සමාගමේ මූලික ව්‍යාපාරික කටයුතුවන මාර්ග ඉදිකිරීම් කර්මාන්තයන්හි කොන්ත්‍රාත් පරිපාලන හා බිල්පත් පියවීම ස්වභාවයන්ට ගැලපෙන පරිදි ප්‍රමාණවත් ආවරණයක් සහිතව මෙම මෘදුකාංග පද්ධතිය නිර්මාණය කර නොතිබීම. • පද්ධතියට ජ'නල් සටහන් ඇතුළත් කිරීමේදී නිසි අවසර දීමේ ක්‍රියාවලියක්	පද්ධතියට ජර්නල් සටහන් ඇතුලත් කිරීමේදි අවසර දීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇති අතර අතිරේක පිටපත් කිරීමේ (backups) පහසුකම් ද සලසා ඇත.	පරිඝනකගත මෘදුකාංග පද්ධතියේ පද්ධති පාලන දුර්වලතා නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය.

ස්ථාපිත කර නොතිබීම.

- වාර්තාකරණ කාල සීමාව අගුලු දමා ඇති විට, පද්ධතියේ පරිපාලකගේ අනුමැතිය ඇතිව ජ'නල් සටහන් ඇතුළත් කිරීමේ දිනය ද වෙනස් කිරීමේ හැකියාව පැවතීම.
- අතිරේක පිටපත් කිරීමේ (backups) පහසුකම් සලසා නොතිබීම.